**කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය,ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව ජංගම නොවන වත්කවල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය සිදු නොකිරීම නිසා ගිණුම් ඉදිරිපත් කල දිනට ප්‍රයෝජනයට ගන්නා දේපල පිරියත උපකරණ වටිනාකම රු.1,989,274 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. 2019 වර්ෂයේ අවසාන ගිණුම් තුළින් මෙය නිවැරදි කරන බව දන්වා සිටිමි. | ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් තැබිය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව ස්ථාවර වත්කම් මිලදී ගැනීම හා කෙරීගෙන යනු ලබන වැඩ සඳහා මුදල් ගලා යෑම රු.99,919,432 ක් ලෙස දක්වා තිබුණද වියදම් වවුචර් පරීක්ෂා කිරීමේදී එහි අගය රු.100,564,540 ක් වූයෙන් එහි රු.645,108 ක වෙනසක් නිරීක්ෂණය විය. | වවුචර් පරීක්ෂා කිරීමේදී කාර්මික නිළධාරියට ගෙවූ මාස 12ක වැටුපද එකතු කර ඇති අතර එම අගයන් හැර වෙනත් වෙනස් කම් පිළිබඳ සොයා බලා ඉදිරියේදී මෙම වෙනස්කම් ගිණුම් තුළින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | නිවැරදිව ගිණුම් තැබීම සිදුකළ යුතුය. |
| (ආ) | වර්ෂයට අදාල පාරිතෝෂිත රු.237,526 ක් අඩුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි. | මෙම මුදල සමන්විත වන්නේ එක් නිලධාරිනියකගේ පාරිතෝෂික ගෙවීම් සඳහා වූ ඌන ප්‍රතිපාදනයන්ය. මෙම ඌන ප්‍රතිපදනයන් මීලග ගිණුම් වර්ෂයේ තවදුරටත් නිවැරදි කරනු ඇත. | ප්‍රතිපාදනයන් නිවැරදිව ගණනය කළ යුතුය |
| (ඇ) | ස්ථාවර වත්කම් යටතේ දැක්වෙන ඵලදායී ජීවකාලය අවුරුදු 10ක් වන පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ කාර්යාල උපකරණ අයිතම 38 ක ඵලදායී ජීව කාලය අවුරුදු 5 සහ 6 ලෙස සලකා ක්ෂය ගණනය කර තිබීමෙන් සමාලෝචිත වසර සඳහා වන ක්ෂය වියදම රු.87,374 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. 2019 වර්ෂයේ අවසාන ගිණුම් තුළින් මෙය නිවැරදි කරන බව දන්වා සිටිමි. | ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන නිවැරදි ක්ෂය ප්‍රතිශත මත ගිණුම් තැබීම සිදුකළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවීන්ගේ භාරකාර අරමුදල මඟින් ශිෂ්‍යයින් 16 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු.3,024,000 ක් වටිනා ණය මුදලින් රු.1,582,935 ක ශේෂයක්ද ග්‍රාමීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ ශිෂ්‍යයින් තිදෙනෙකු වෙත 2012 | නීති සම්පාදන කමිටු අනුමැතිය ලද පසු ණය වාරික ගෙවීම් පැහැර හැර ඇති ශිෂ්‍යයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ. | ලැබිය යුතු ණය කාර්යක්ෂමව අයකරගත යුතුය. |

වර්ෂයේ ලබාදුන් රු.312,000 ක් වටිනා ණය මුදලින් රු.58,100 ක් සහ "Planting Material" යන ණය යෝජනා ක්‍රමය යටතේ ශිෂ්‍යයින් 06 දෙනෙකුගෙන් රු.420,810 ක ණය ශේෂයක්ද අයකර ගෙන නොතිබුණි.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අදාළ කාර්යය නිම වූ වහාම අත්තිකාරම් පියවිය යුතු වුවත් අවස්ථා 08කදී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.477,500 ක අත්තිකාරම් පියවීම සඳහා දින 65 සිට දින 180ක් දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. | අත්තිකාරම් ලබා ගත හැකි අය දෙදෙනෙකු පමනක් ඇති අතර පියවීමේදී මෙය මග හැරී ප්‍රමාද වී ඇති අතර ඉදිරියේ දී මෙවැනි දේ නොවීමට වග බලා ගනු ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 2/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සෑම මුදල් වර්ෂයකම ජනවාරි 15 දිනට පෙර භෞතික භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර මාර්තු 17 වන දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | මෙම කටයුත්ත ඉතාමත් විධිමත් භාවයෙන් ඉටු කිරීම සඳහා බාහිර පාර්ශවයක් ලෙස හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයට පාවරා ඇති අතර එම පාර්ශවයේ අධික රාජකාරි බහුලතාව මත මෙවර භෞතික භාණ්ඩ සමීක්ෂණ කටයුතු මදක් ප්‍රමාද විය. | අදාළ චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,019,352 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,201,287 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,220,639 ක පිරිහීමක් විය. මෙම පිරිහීමට පටක රෝපණ පැල විකුණුම් ආදායම අඩුවීම සහ පෞද්ගලික පඩිනඩි වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විෂයය | 2018 | 2017 | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| ආදායම | 15,219,211 | 19,550,958 | (4,331,747) | (22) |
| පොලී ආදායම | 1,502,520 | 3,968,763 | (2466,243,) | (62) |
| උපයාගත් ආදායම (වෙනත්) | 17,623,404 | 5,565,396 | 12,058,008 | 217 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කෙසෙල් පැල නිෂ්පාදනය හා අලෙවිය අඩු වීම හේතුවෙන් ආදායම සියයට 22 කින් ද 2017 වර්ෂයේ පැවති රු.මිලියන 78 ක ආයෝජන නිදහස් කර ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම සියයට 62 කින් අඩු වී තිබුණි.

(ආ) 2017 වර්ෂයේ බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 178 ක් වූ අතර 2018 වර්ෂයේදී ශිෂ්‍ය සංඛ්‍යාව 277 දක්වා වැඩිවීම හේතුවෙන් උපයාගත් ආදායම සියයට 217 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙම ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණික පීයය ලෙස හඳුන්වා දීමට 2018 වර්ෂයේ කටයුතු කර තිබුණු අතර නව යෝජනාව අනුව අධ්‍යයන අංශ 04ක් පිහිටුවා එමගින් උපාධි පාඨමාලා 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. එහෙත් ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලැබී නොතිබූණි. | මේ වන විට මේ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව පාලන අංශය (Quality Assurance Council) වෙත අනුමැතිය ලැබී ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ Standing Committee හී දී සාකච්ජා වෙමින් පවතී | අනුමැතිය ලබාගැනීමෙන් පසු පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු අක්කර 50 ක භූමි භාගය තුළ ආයතනය පිහිටුවා එහි ඉදිකිරීම් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එහි අයිතිය පවරාගෙන නොතිබුණි. | අක්කර 50 ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ආයතනයට පවරා ගැනීම සඳහා, දැනට ආයතනය පැත්තෙන් සිදු කල යුතු සියලු කටයුතු සිදු කර අවසන්ය.<br><br>එසේම මෙම අක්කර 50 ඉඩම් කොටස සඳහා දැනට රු.1,080,000 ක බදු මුදලක් ද ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙවා ඇත. එසේම , 2017 වර්ෂය අග භාගයේ දී, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දී අක්කර 50ට අදාල නීත්‍යානුකූල ලියවිලි අත්සන් කල ද මේ වන තෙක් එම ලේඛන අප වෙත ලැබී නොමැත. | භූමිය නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා කටයුතු කඩිනමින් අවසන් කරගත යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය සතුව 2016 සහ 2017 වර්ෂවලදී මිලදී ගත් රු.643,498 ක් වටිනා පුස්තකාල පොත් 145 ක් පැවති අතර ආයතනයේ පුස්තකාලයක් නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මෙම පොත් සිසුන්ට ඵලදායී ලෙස පරිහරණය කිරීමට අවස්ථාවක් නොතිබුණි. | මෙම පොත් මේ වන විට ආචාර්ය මණ්ඩලය හරහා සිසුන් ගේ පරිහරණයට ලබාදෙන අතර හැකි ඉක්මණින් මේ සඳහා ස්ථානයක් ලබාදීමට කටයුතු කරනු ඇත. | පොත් පරිහරණය සඳහා සුදුසු වැඩ පිළිවෙලක් කඩිනමින් සකස් කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතනයෙහි ප්‍රසම්පාදන සැලැස්මට අනුව එකතු වටිනාකම රු.47,870,000 ක් වූ ප්‍රසම්පාදනයන් 21ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර නොතිබුණි.<br>(ආ)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදනයන් වෙනුවෙන් සකස් කර ඇති පිරිවිතරයන් සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුවල වගකීම වුවද නියැදි පරීක්ෂාවේ දී රු.1,816,348 ක් | රජය විසින් දෙනු ලබන ප්‍රතිපාදන නිසි වෙලාවට නොලැබීම හා අනුමත මුළු මුදලම නොලැබීම ආදී කරුණු මත මූල්‍යමය අපහසුතා මධ්‍යයේ බොහෝ ප්‍රසම්පාදන සිදු කරන අතර එවැනි තත්ත්වයන් තුල බොහෝ සැලසුම් ගත කරනු ලබන ප්‍රසම්පදනයන් ප්‍රමාද වන අතර 2018 වසර සඳහා ලැබිය යුතු රු . මිලියන 3.05 මේ වන තෙක් නිදහස් කර නැත .එසේම ආයතනය තුල සියලුම අංශයන්හි නිසියාකාරයෙන් ක්‍රියාකාරකම් සිදුකිරීමට පොදුවේ සීමාසහිත සේවක පිරිසක් සිටින බැවින් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් පරිදි හා විනිවිදභාවයකින් යුතුව ප්‍රසම්පාදනයන් සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| වටිනා ප්‍රසම්පාදනයන් 06 ක් සම්බන්ධව එසේ තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි.<br>(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3(ආ) මාර්ගෝපදේශය අනුව ලංසු කැඳවීම අවසන් වනවාත් සමගම හැකිතාක් ඉක්මණින් ලංසු විවෘත කළ යුතු වුවත් නියමිත දිනය ඉක්මවා දින 02 සිට දින 38 දක්වා ප්‍රමාද වී ලංසු විවෘත කළ අවස්ථා 06 ක් පැවතුණි. | සියලු කාර්යන් සැලසුම් ගත අයුරින්ම සිදු කිරීම අපහසු බවට පත්ව ඇත. | |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 36 දෙනෙකු වුවද තත්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 11 දෙනෙකු වූයෙන් සමස්ත කාර්ය මණ්ඩල ඌනතාවය 25 දෙනෙකු විය. ඒ තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරු 05 දෙනෙකුගේ ඌනතාවයක් පැවතුණි. | ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් තනතුරු 24ක් අනධ්‍යයන තනතුරු වන බැවින්, 876 චක්‍රලේඛය ප්‍රකාරව එම තනතුරු සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලැයිස්තුවකින් නියමිත ක්‍රමවේදය ප්‍රකාරව බඳවා ගත යුතුය. 2019 වර්ෂය අවසන් වීමට පෙර අනධ්‍යයන තනතුරු සියලු පුරප්පාඩු පිරවීමට අපේක්ෂා කෙරේ.<br>අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරු 05 දෙනාගෙන්, නියමිත බඳවා ගැනීම් පටිපාටිය අනුගමනය කර එක් කථිකාචාර්යවරයෙකු බඳවා ගත් අතර, ඉතිරි දෙදෙනා බඳවා ගැනීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතියට යොමු කර 2019 වසරේ මුල් භාගයේ ඒ සඳහා අනුමැතිය හිමි නොවන බව දැන් වූ බැවින් නැවත ඇබෑර්තු දැන්වීම් පල කර අයදුම්පත් කැඳවා ඇත. | පුරප්පාඩු කඩිනමින් පිරවිය යුතුයි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ කාර්යසාධන දර්ශක අනුව ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී ක්‍රියාකාරකම් 11 ක කිසිදු ප්‍රගතියක් නොතිබූ අතර ක්‍රියාකාරකම් 06 ක ප්‍රගතිය සියයට 2 සිට සියයට 33 ක් දක්වා අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති සමහර ක්‍රියාකාරකම් ප්‍රගතියකින් තොරව අවසන් වී ඇත්තේ ප්‍රාග්ධන අරමුදල් ප්‍රමාණවත් පරිදි ආයතනයට අනුමත නොවීම හා අනුමත මුලු මුදලම නොලැබීම නිසාය.මීළග ගිණුම් වර්ෂය තුල මෙම කටයුතු නිසි ආකාරයෙන් සිදු කිරිමට අදාල ක්‍රියාකාරී සැලසුම් සකස් කරනු ඇත | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ඉටුකිරීමේ අරමුණින් කාලපරිච්ඡේදය තුළ කටයුතු කල යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයවැය හා තත්‍ය වියදම් සැසදීමේදී අභ්‍යන්තර ඉපයූ ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 45 කින් අඩු වී තිබූ අතර වියදම් විෂයයන් 05 ක අයවැය ගත ප්‍රතිපාදනය හා තත්‍ය වියදම සැසදීමේදී විචලනය සියයට 23 සිට සියයට 42 දක්වා පරාසයක පැවතුණි. | සමාලෝචිත වර්ෂයේ අයවැය හා තත්‍ය වියදම් සැසදීමේදී වියදම් අධි පුරෝකථනයක් සිදු කර තිබූ බව දැක්වෙන නිරීක්ෂණය සමග එකඟ විය හැකි අතර එසේ වීමට හේතුව ආයතනය තුල සිදුවන සීඝ්‍ර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාශීලිව පැවතීමයි .එවැනි කටයුතු සිදු කිරීමේදී ප්‍රාග්ධන මෙන්ම පුනරාවර්තන වියදම්ද ඒ වෙනුවෙන් දැරීමට සිදුවන අතර අයවැය ගත ප්‍රතිපාදන මතම කටයුතු කිරීම ප්‍රායෝගිකව ඉතාමත් අපහසු කාර්යකි . එසේම පටක රෝපණ අංශයේ අනපේක්ෂිත අයුරින් සිදු වූ පසුබැසීම ආදායම් පුරෝකථන වෙනස් වීමට හේතුවූ අතර මීළඟ වර්ෂයේදී අයවැය සකස් කිරිමේදී මේ පිළිබඳ දැඩි අවධානයක් යොමු කරමින් කටයුතු කරනු ලැබේ. | අයවැය තාත්වික ලෙස පිළියෙල කර ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය. |